# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019

## 64 - දෙවන බස සිංහල

## ලකුණු ව්‍යුහය

**I පත්‍රය** : බහුවරණ ප්‍රශ්න 40 කි. ලකුණු 40 යි.

**II පත්‍රය** : කොටස් තුනකි. ප්‍රශ්න 06 න් 04 කට උත්තර ලිවිය යුතු ය. ලකුණු 60 යි.

**එකතුව** 100 යි.

## II පත්‍රය

| | | | |
|---|---|---|---|
| **I කොටස** | 1 ප්‍රශ්නය | ලකුණු 20 යි | **අනිවාර්යයි.** |
| | 2 ප්‍රශ්නය | ලකුණු 10 යි | |
| **II කොටස** | 3 ප්‍රශ්නය | ලකුණු 10 යි | **ප්‍රශ්න එකයි** |
| | 4 ප්‍රශ්නය | ලකුණු 10 යි | |
| **III කොටස** | 5 ප්‍රශ්නය | ලකුණු 10 යි | **ප්‍රශ්න දෙක ම** |
| | 6 ප්‍රශ්නය | ලකුණු 10 යි | |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .......................................................... √ △ $\frac{4}{5}$
..........................................................
..........................................................

(ii) .......................................................... √ △ $\frac{3}{5}$
..........................................................
..........................................................

(iii) .......................................................... √ △ $\frac{3}{5}$
..........................................................
..........................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක් වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කරන ලැබ ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කරනු ලැබ ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ප්‍රමාණය ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍ය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍ය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සෑම විට ම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

**පළමු වැනි පත්‍රය,**

## උපදෙස්

1. ඔබ පිළියෙල කරගත් කවුළු පත හෝ තීරු පත ප්‍රධාන පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.
2. පළමුවෙන් ම උත්තර පත්‍රය පරීක්ෂා කර එක් ප්‍රශ්නයක් සඳහා පිළිතුරු එකකට වඩා ලකුණු කොට ඇත්නම් හෝ කිසිදු වරණයක් ලකුණු කොට නැත්නම් හෝ වරණ හතර ම කැපී යන සේ ඉරක් අඳින්න.
3. සෑම උත්තරයක් ම හරිබව හෝ වැරදිබව හෝ පැහැදිලිව ම අදාළ ප්‍රශ්න අංකය මත ම ලකුණු කරන්න.
4. අපේක්ෂකයා ලකුණු කොට ඇති පිළිතුරු මත හරි, වැරදි (✓,✕) ලකුණු නොදමන්න.
5. කවුළු පතේ වරණ කොටු ඉදිරියේ ඇති හිස් තීරය කවුළුවක් වන සේ කපා හැර එම තීරුවෙහි ම හරි හෝ වැරදි බව හෝ දක්වන්න.
6. කවුළු පතක් හෝ තීරු පතක් යොදා ගන්නා විට නිවැරදි සීහුම ගැන විශේෂයෙන් පරිස්සම් වන්න.
7. එක් එක් තීරුවෙහි නිවැරදි උත්තර සංඛ්‍යාව පහළට එකතුකොට නිවැරදි පිළිතුරු ගණන ....... යි අදාළ කොටුව තුළ ලියන්න.
8. ලකුණු එකතු කිරීම, එම ලකුණු දෙවන පත්‍රයේ සටහන් කිරීම යන අවස්ථාවල දී බෙහෙවින් පරීක්ෂාකාරී වන්න.
9. " ✓ " ආදි ලකුණින් පිළිතුරු ලකුණු කර තිබුණ ද පිළිතුර දීම සඳහා විශේෂ පත්‍රිකාව භාවිත නොකොට ප්‍රශ්න පත්‍රයෙහි ම ඉරි ඇඳීම ආදි වශයෙන් ලකුණු කොට තිබුණ ද පිළිගන්න.
10. මේ පත්‍රයට හිමි මුළු ලකුණු ගණන 40 කි. එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 ක බැගිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**64 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
Second Language - Sinhala I, II

2019.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் **மேலதிக வாசிப்பு நேரத்தைப்** பயன்படுத்துக.

Use **additional reading time** to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.

**දෙවන බස - සිංහල I இரண்டாம் மொழி - சிங்களம் I Second Language - Sinhala I**

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට උත්තර සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**கவனிக்க :**

(i) **எல்லா** வினாக்களுக்கும் விடை எழுதுக.
(ii) **1** தொடக்கம் **40** வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும். (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் **சரியான அல்லது மிகப் பொருத்தமான** விடையைத் தெரிவுசெய்க.
(iii) **உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.**
(iv) அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்துப் பின்பற்றுக.

**Note :**

(i) *Answer **all** questions.*
(ii) *In each of the questions from* **1** *to* **40,** *pick one of the alternatives* (1), (2), (3), (4) *which you consider is **correct or most appropriate.***
(iii) ***Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet.***
(iv) *Further instructions are given on the back of the answer sheet. Follow them carefully.*

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.

  **1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.

  In questions **1** to **5,** select the most suitable pair of words for the word printed in **bold letters.**

**1.** හෙට කවුරුත් **යන්නැතිව** ඉන්න.
(1) යන නැතිව (2) යන් නැතිව (3) යන්නෙ නැතිව (4) යන්න නැතිව

**2.** **යාළුවත්තෙක්ක** පන්තියට යන්න.
(1) යාළුවත් එක්ක (2) යාළුවා තෙක්ක (3) යාළුවත් තෙක්ක (4) යාළුවාට එක්ක

**3.** අන්න **නංගිත්තෙනවා**
(1) නංගි එනවා (2) නංගිත් එනවා (3) නංගි තෙනවා (4) නංගිත් තෙනවා

**4.** චාරිකාව යන්න **මමත්තෙන්න ද**?
(1) මා එන්න ද   (2) මම තෙන්න ද   (3) මමත් එන්න ද   (4) මමත් තෙන්න ද

**5.** තරගයට **දුවන්නැති** අය ඇතට යන්න.
(1) දුවන නැති   (2) දුවන්නෙ නැති   (3) දුවන්න නැති   (4) දුවන් නැති

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත පදය තෝරන්න.
**6** தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் சொல்லைத் தெரிவுசெய்க.
In questions **6** to **10,** select the word with **correct pronounciation** from the words given.

**6.** (1) පද්දරය   (2) පත්දරය   (3) පත්තරය   (4) පද්තරය

**7.** (1) තාප්පය   (2) තාබ්බය   (3) තාප්බය   (4) තාබ්පය

**8.** (1) වතුරුබිම   (2) වගුරුබිම   (3) වකුරුපිම   (4) වතුරුපිම

**9.** (1) අදරමැද   (2) අතරමැත   (3) අදරමැත   (4) අතරමැද

**10.** (1) කන්තෝරුව   (2) කන්දෝරුව   (3) ගන්දෝරුව   (4) ගන්තෝරුව

- අංක **11** සිට **14** තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
**11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவுசெய்க.
In questions **11** to **14,** select the **most appropriate** question for the given statement.

**11.** මම උදේ අටට එනවා.
(1) ඔයා එන්නේ කීයට ද?   (2) ඔයා එනවා කීයට ද?
(3) ඔයාට එන්නේ කීයට ද?   (4) ඔයාත් එන්නේ කීයට ද?

**12.** මල්ලිගෙ අතේ පෑනක් තියෙනවා
(1) මල්ලිගෙ අතේ තියෙනවා මොකක් ද?   (2) මල්ලිගෙ අතේ තියෙන්නෙ මොකක් ද?
(3) මල්ලිගෙ අත තියෙනවා මොකක් ද?   (4) මල්ලිගෙ අතට තියෙන්නේ මොකක් ද?

**13.** අක්කා පොතක් කියවනවා.
(1) අක්කා පොතේ කියවනවා ද?   (2) අක්කා පොතකට කියවනවා ද?
(3) අක්කාට පොත කියවනවා ද?   (4) අක්කා පොතක් කියවනවා ද?

**14.** කුමාර් දුවගෙන එනවා.
(1) දුවගෙන එනවා කවරෙක් ද?   (2) දුවගෙන එන්නේ කවරෙක් ද?
(3) දුවන්න එන්නේ කවරෙක් ද?   (4) දුවන්න එනවා කවරෙක් ද?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති පදය තෝරන්න.
**15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக் கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவுசெய்க.
In questions **15** to **17,** select the word with **correct spellings.**

**15.** (1) විශිශ්ට   (2) විෂිෂ්ට   (3) විශිෂ්ට   (4) විෂිශ්ට

**16.** (1) නිශ්ෂබ්දතාව   (2) නිශ්සබ්දතාව   (3) නිෂ්ශබ්දතාව   (4) නිශ්ශබ්දතාව

**17.** (1) අවධාරණය   (2) අවදාරනය   (3) අවධාරනය   (4) අවදාරණය

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
**18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவுசெய்க.
In questions **18** to **20,** select the **inappropriate** word.

**18.** (1) බස්එක   (2) කාර්එක   (3) වෑන්එක   (4) ෆෑන්එක

**19.** (1) හැරුවා   (2) යනවා   (3) එනවා   (4) දුවනවා

**20.** (1) පොත   (2) සඟරාව   (3) ලිපිය   (4) පතල

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
  In questions **21** to **23**, select the **synonym** for the word given at the beginning.

**21.** මාර්ගය : (1) මාරුව (2) පාර (3) අවසානය (4) වර්ගය

**22.** විපත : (1) නිදහස (2) අසිපත (3) කරදරය (4) උපත

**23.** ප්‍රවේශය : (1) පිටවීම (2) පිවිසීම (3) ආරාධනය (4) ආවේගය

- අංක **24** සහ **25** ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **24, 25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **எதிர்க்கருத்தைத் தரும்** சொல்லைத் தெரிவுசெய்க.
  In questions **24** and **25**, select the **antonym** for the word given at the beginning.

**24.** ආරම්භය : (1) අවසානය (2) සමාරම්භය (3) අරමුණ (4) අවධානය

**25.** ඇතුළුවීම : (1) ඇවිදීම (2) ඇතුළත (3) පිහිටීම (4) පිටවීම

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන ප්‍රකාශය** තෝරන්න.
  **26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கூற்றைத்** தெரிவுசெய்க.
  In each question from **26** to **28**, select the **most suitable statement** for the picture given.

**26.**




(1) වාහන නවතා තබන ස්ථානය
(2) වාහන නැවැත්වීම තහනම්
(3) මාර්ගය හරහා ගමන් කිරීම තහනම්
(4) වාහන පිටවීමට පමණයි

**27.**



(1) ඉන්ධන පිරවුම්හල
(2) වහා ගිනි ඇවිලෙනසුලු ය
(3) ගින්දර භාවිතය තහනම්
(4) කර්මාන්ත ශාලාව ඉදිරියෙනි

**28.**



(1) ජංගම දුරකථන විකිණීමට ඇත
(2) ඉලෙක්ට්‍රොනික උපකරණ තහනම්
(3) ජංගම දුරකථන අලෙවිසල
(4) ජංගම දුරකථන භාවිතය තහනම්

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
  **29, 30** ஆகிய வினாக்களுக்குப் **பொருத்தமான விடையைத்** தெரிவுசெய்க.
  For questions **29** and **30**, select the **suitable answer.**

**29.** අද සෙනසුරාදා නම් අනිද්දා කවරදා ද?
(1) ඉරිදා (2) සඳුදා (3) අඟහරුවාදා (4) සිකුරාදා

**30.** ජීවත් වීම සඳහා කරන රැකියාව
(1) ජීවනාලිය (2) ජීවිතාරක්ෂාව (3) ජීවනෝපාය (4) ජීවිතාදර්ශය

- අංක **31** සහ **32** ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදි ව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.

  **31, 32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் **சரியாக** இணைத்து ஒரு வாக்கியமாக்கி **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவுசெய்க.

  In questions **31** and **32,** two sentences are given. Select the **sentence** that **correctly** combines the two sentences.

**31.** මම රෝහලට ගියෙමි. වෛද්‍යවරයා හමුවුණෙමි.
(1) මම රෝහලට ගිය නිසා වෛද්‍යවරයා හමුවුණෙමි.
(2) මම රෝහලට ගියොත් වෛද්‍යවරයා හමුවුණෙමි.
(3) මම රෝහලට ගියා වෛද්‍යවරයා හමුවුණෙමි.
(4) මම රෝහලට ගොස් වෛද්‍යවරයා හමුවුණෙමි.

**32.** මනුර උදෙන් ම පාසලට පැමිණියේ ය. පන්තිය පිරිසිදු කළේ ය.
(1) මනුර උදෙන් ම පාසලට පැමිණ පන්තිය පිරිසිදු කළේ ය.
(2) මනුර උදෙන් ම පාසලට පැමිණියේ පන්තිය පිරිසිදු කළේ ය.
(3) මනුර උදෙන් ම පාසලට පැමිණෙමින් පන්තිය පිරිසිදු කළේ ය.
(4) මනුර උදෙන් ම පාසලට පැමිණෙන්නට පන්තිය පිරිසිදු කළේ ය.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු පදය** තෝරන්න.

  **33, 34** ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.

  In questions **33** and **34,** select the **most suitable word** for filling each blank.

**33.** කුමාරි ..................................... සහභාගි වුණා.
(1) තරගයක් (2) තරගයට (3) තරගයෙන් (4) තරගය

**34.** ඔහු ..................................... දිවුවා.
(1) වේගයට (2) වේගය (3) වේගයෙන් (4) වේගයේ

- අංක **35** ප්‍රශ්නයේ **කළු කර** ඇති සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති උත්තරය තෝරන්න.

  **35** ஆம் வினாவில் **தடித்த எழுத்திலுள்ள** எண் சரியான எழுத்துகளால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவு செய்க.

  In question **35** select the answer that gives in letters correctly the number in **bold** print.

**35.** මුහුදු වෙරළ මීටර **1362** ක් දිග ය.
(1) එක්දහස් තුන්සිය හැට දෙක (2) එක්දහස් තුන්දහස් හැට දෙක
(3) එකසිය තුන්දහස් හැට දෙක (4) එකසිය තුන්සිය හැට දෙක

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

  **36** தொடக்கம் **40** வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கண ரீதியாக சரியான** வாக்கியத்தைத் தெரிவு செய்க.

  In each question from **36** to **40,** select the **gramatically correct** sentence.

**36.** (1) අපි කොඩි කණුව සිටවමි. (2) අපි කොඩි කණුව සිටවයි.
(3) අපි කොඩි කණුව සිටවති. (4) අපි කොඩි කණුව සිටවමු.

**37.** (1) වෙළෙන්දෝ බඩු විකුණයි. (2) වෙළෙන්දන් බඩු විකුණයි.
(3) වෙළෙන්දෝ බඩු විකුණති. (4) වෙළෙන්දන් බඩු විකුණති.

**38.** (1) මහ වැස්සට වැව් පිරී යයි. (2) මහ වැස්සට වැව් පිරී යති.
(3) මහ වැස්සට වැව් පිරී යන්නෝ ය. (4) මහ වැස්සට වැව් පිරී යනු ලබයි.

**39.** (1) තරගයට තිදෙනෙක් සහභාගි විය. (2) තරගයට තිදෙනෙකු සහභාගි විය.
(3) තරගයට තිදෙනෙක් සහභාගි වූහ. (4) තරගයට තිදෙනෙකු සහභාගි වූහ.

**40.** (1) අම්මා කිරිබත් ඉවුවේ ය. (2) අම්මා කිරිබත් ඉවුවෝ ය.
(3) අම්මා කිරිබත් ඉවුවා ය. (4) අම්මා කිරිබත් ඉවුවෙමි.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය<br>பாட இலக்கம் | 64 | විෂයය<br>பாடம் | දෙවන බස - සිංහල |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 01 | 21. | 02 | 31. | 04 |
| 02. | 01 | 12. | 02 | 22. | 03 | 32. | 01 |
| 03. | 02 | 13. | 04 | 23. | 02 | 33. | 02 |
| 04. | 03 | 14. | 02 | 24. | 01 | 34. | 03 |
| 05. | 02 | 15. | 03 | 25. | 04 | 35. | 01 |
| 06. | 03 | 16. | 04 | 26. | 01 | 36. | 04 |
| 07. | 01 | 17. | 01 | 27. | 01 | 37. | 03 |
| 08. | 02 | 18. | 04 | 28. | 04 | 38. | 01 |
| 09. | 04 | 19. | 01 | 29. | 02 | 39. | 03 |
| 10. | 01 | 20. | 04 | 30. | 03 | 40. | 03 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |
|---|---|---|---|

# 64 - දෙවන බස සිංහල

# II පත්‍රය

## 01. ප්‍රශ්නය

**අපේක්ෂණ :**

i. තෝරාගත් මාතෘකාවේ සෑම අංශයක් ගැන ම සලකා බලමින්, ඡේද බෙදා කරුණු ගෙන හැර දැක්වීම මගින් සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කිරීම.

ii. එකිනෙකට සම්බන්ධ වන සේ වාක්‍ය ලිවීම

iii. අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු පද බෙදා ලිවීම ප්‍රකාශන හැකියාව ප්‍රදර්ශනය කිරීම

**I කොටස / பகுதி I / Part I**

1. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** පිළිබඳ **වචන 100**ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவுசெய்து அதன் கீழே தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ **100 சொற்களில்** அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.
Write an essay of about **100 words** on any **one** of the following topics in accordance with the given guidelines.

(අ) අපේ පාසලේ ක්‍රීඩා උත්සවය
- (i) හැඳින්වීම
- (ii) ක්‍රීඩා උත්සවය සඳහා නිවාස සකස් කළ ආකාරය
- (iii) ක්‍රීඩා උත්සවයේ පැවැත් වූ තරග
- (iv) සහතික හා කුසලාන ප්‍රදානය කිරීම
- (v) සමාලෝචනය

(ආ) වැසි දිනක්
- (i) හැඳින්වීම
- (ii) වැසි දිනක සිදුවන පරිසරයේ වෙනස්කම්
- (iii) වැස්ස, මිනිසුන්ගේ කටයුතුවලට බලපාන ආකාරය
- (iv) වැස්ස නිසා සිදුවන හානි
- (v) සමාලෝචනය

(ඉ) භාෂා කඳවුර
- (i) හැඳින්වීම
- (ii) භාෂා කඳවුරක පවතින විවිධ අංග
- (iii) භාෂා කිහිපයක් දැනගැනීමේ වැදගත්කම
- (iv) භාෂා කඳවුරකින් භාෂා කතා කිරීම දියුණු වන ආකාරය
- (v) සමාලෝචනය

(ඊ) කෞතුකාගාරය නැරඹීමු
- (i) හැඳින්වීම
- (ii) කෞතුකාගාරයක දැකිය හැකි දේවල්
- (iii) කෞතුකාගාරය නැරඹීමේ ගමන සංවිධානය කළ ආකාරය
- (iv) කෞතුකාගාරයේ ඇති දේවල් රැක ගැනීමේ වැදගත්කම
- (v) සමාලෝචනය

(උ) ගමේ පෙරහැර
- (i) හැඳින්වීම
- (ii) පෙරහැරක දැකිය හැකි දේවල්
- (iii) පෙරහැරක් සංවිධානය කරන ආකාරය
- (iv) පෙරහැරක් පැවැත්වීමෙන් සමාජයට දිය හැකි ආදර්ශ
- (v) සමාලෝචනය

**ලකුණු ව්‍යුහය**

ලකුණු ප්‍රදානයේ දී පහත සඳහන් අංශ හා ඒ පිළිබඳ ව ඇති විස්තර කෙරෙහි අවධානය යොමු කරන්න.

**(අ) අදහස් : ලකුණු 06 යි**

- මාතෘකාව ගැන පුළුල් ලෙස සලකා තිබීම
- කරුණුවල සාරවත්භාවය
- ප්‍රමාණවත් බව

**(ආ) රචනා රීතිය හා සංවිධානය : ලකුණු 10 යි**

- ඡේද බෙදා ලිවීම හා ඒවායේ ගැළපීම
- සුදුසු වචන හා වාක්‍යාංශ යොදා තිබීම
- නිර්මාණාත්මක බව
- නිවැරදි වචන භාවිතය
- වැරැදි ලෙස ලියා ඇති එක් වචනයකට ලකුණු 1 බැගින් පහක (05 ) උපරිමයකට සීමාකොට ලකුණු අඩු කරන්න. එකම වචනය කිහිප තැනකම වරදවා ලියා ඇතොත් ඒ සියලු වැරැදි එක් වරදක් සේ සලකන්න.

**(ඇ). ශිල්පීය දක්ෂතා : ලකුණු 04 යි**

- ව්‍යාවහාරික සරල ව්‍යාකරණ රීති රැකීම
- පැහැදිලි අත් අකුරු
- පද බෙදා ලියා තිබීම
- විරාම ලකුණු භාවිතය

මේ කරුණු සමස්තයක් වශයෙන් සලකා, ලකුණු තීරණය කරන්න.

**සැලකිය යුතුය**

1. වචන සංඛ්‍යාව 65 - 90 අතරේ ඇති රචනයකට දිය හැකි උපරිම ලකුණු ගණන 15 කි. වචන 50-64 අතරේ ඇති කල්හි දිය හැකි උපරිම ලකුණු ගණන 10 කි. වචන 40-49 අතරේ ඇති කල්හි දිය හැකි උපරිම ලකුණු ගණන 05 කි. වචන 40 ට ද අඩු කල්හි අනුපාතික ව ලකුණක් දෙන්න.
   ලකුණු දීමේ දී මුලින් දැක්වූ අ, ආ, ඇ, යන කොටස් හැම විට ම සැලකිල්ලට ගත යුතුය.

2. අ, ආ, ඇ, යන කොටස් සඳහා ලකුණු වෙන වෙන ම දී එකතු කොට ප්‍රශ්නයේ අවසාන ලකුණු $\frac{?}{20}$ යි දක්වන්න.

3. නිවැරදි හා ගැළපෙන අදහස් ඇති තැන්වල " ✓ " ලකුණු ද වැරැදි අදහස් ඇති තැන්වලට " X " ලකුණු ද යොදන්න . උක්තාඛ්‍යාත සම්බන්ධය වැරැදි තැන්වල යටින් ඉරක් අඳින්න. වැරැදි වචනවල වැරැදි තැන්වලට " ◯ " රවුමක් යොදන්න.

**2. ප්‍රශ්නය**

**අපේක්ෂණය : දෙන ලද පින්තූරයක/ ඡායාරූපයක දැක්වෙන එක් එක් අවස්ථා හා සිද්ධි පිළිබඳ අවධානය යොමු කර ඒවා ලිඛිත බසින් නිවැරදිව ලිවීමේ හැකියාව මැන බැලීම**

**2.** දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක්වත්** තිබිය යුතු ය.)

தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.)

Compose **five** meaningful sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence).



**අපේක්ෂිත උත්තර**

(i) පිරිමි ළමයි තුන් දෙනෙක් සිටිති.

(ii) කාන්තාවක් කුඩයක් ඉහළා ගෙන එයි.

(iii) මෙම පින්තූරයෙන් පෙනෙන්නේ වැසි සහිත දර්ශනයකි.

(iv) ළමයි වැස්සට තෙමී සිටිති.

(v) පොල් ගස සුළඟට වැනෙයි.

(vi) පින්තූරයේ ගොඩනැගිල්ලක් පෙනෙන්නට තිබේ.

(vii) ඉතා තදින් වැස්ස වසියි.

(viii) මිදුලේ වතුර පිරී ඇත / තිබේ.

(ix) පොල් අත්තක් ගසින් බිමට වැටෙයි.

(x) අහසේ අකුණු ගසනවා පෙනෙයි.

(xi) ළමයි අත දික් කරමින් කාන්තාවක පෙන්වති.

(xii) මිදුල වැස්සෙන් යට වී ඇත.

(xiii) ගුරුවරියගේ / කාන්තාවගේ කුඩය සුළඟට නැමී ඇත.

(xiv) ළමයෙක් කොට බිත්තියට අත තබා සිටියි.

(xv) ළමයෙක් සිනාසෙමින් ඈත බලයි / බලා සිටියි.

* පින්තූරයට අදාළ ව ලියා ඇති මේ හා සමාන වෙනත් අදහස් ද පිළිගන්න.
* ලිඛිත භාෂාවෙන් නිවැරදි වාක්‍ය ලියා තිබීම අවශ්‍ය වේ.
  (එක් වාක්‍යයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 කි.)
* වාක්‍ය කථන බසින් ලියා ඇත්නම් වාක්‍යයකට ලකුණු 01 ක් පිරිනමන්න.

**(ලකුණු 02 x 5 = 10 යි)**

**3 ප්‍රශ්නය**

**අපේක්ෂණය - දෙනු ලබන පද්‍ය පාඨයක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව මැන බැලීම**

**II කොටස / பகுதி II / Part II**

- **3** හා **4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.
  **3** ஆம் **4** ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
  From questions **3** and **4,** answer only **one** question.

**3.** පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, அதன் கீழ் கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

ඉද්ද මලයි රෝස මලයි
තරගෙට වාගේ
මිදුල මැද්දෙ හිනාවෙනව
හිමිදිරි උදයේ

ඉද්ද මලේ සුදට සුදේ
ඇයි හිනැහෙන්නේ
රෝස මලේ රෝස පාට
නැහැ පරදින්නේ

සමන් පිච්ච පොකුරු පොකුරු
පිපිල තිබෙනවා
සමගි වෙලා ඉන්න අයුරු
අපට කියනවා

(i) මිදුල මැද හිනාවෙන මල් මොනවා ද?

(ii) සමන් පිච්ච මල් පිපී තිබෙන්නේ කොහොම ද?

(iii) සමන් පිච්ච මල් අපට ලබා දෙන පණිවුඩය කුමක් ද?

(iv) 'වර්ණය' යන්නට සමානාර්ථය දෙන පදයක් කවිපෙළෙන් තෝරා ලියන්න.

(v) මෙහි පරදින්නේ නැතැයි කියන්නේ මොනවා ද?

**3 ප්‍රශ්නය - අපේක්ෂිත උත්තර**

(i) ඉද්ද, රෝස / ඉද්ද මල්, රෝස මල් / රෝස මලයි ඉද්ද මලයි.

(ii) පොකුරු ලෙස / පොකුරු පොකුරු / පොකුරු පොකුරු පිපී තිබේ / තියනවා

(iii) සමගිය / සමගි වී සිටින අයුරු

(iv) පාට

(v) රෝස මලේ රෝස පාට

**(ලකුණු 02 x 5 = 10 යි)**

**4 ප්‍රශ්නය**

**අපේක්ෂණය - දෙනු ලබන ගද්‍ය පාඨයක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව මැන බැලීම**

4. පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, அதன் கீழ் கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following paragraph.

"ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය ගාල්ල කොළඹ නගර යා කරමින් ඉදිකරන ලදි. එහි දෙවන අදියර ලෙස මාතර කොළඹ අධිවේගී මාර්ගය ද මේ වන විට විවෘත කර ඇත. අපේ රටේ ශීඝ්‍ර සංවර්ධනයට මෙම අධිවේගී මාර්ග ඉවහල් වේ. ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ඉතා පහසුවෙන් හා කඩිනමින් කර ගැනීම මෙහි අරමුණයි." අධිවේගී මාර්ගයක විශේෂ ලක්ෂණ රාශියකි. අධිවේගී මාර්ගය මං තීරු හතරකින් යුක්ත ය. ප්‍රධාන ප්‍රවේශ ස්ථාන කිහිපයකින් සමන්විත ය. සියලු රථවාහන, මාර්ගයට ඇතුළු වීමේ දී ප්‍රවේශ පත්‍ර ලබා ගත යුතු ය. පිටවීමේ දී ගාස්තු ගෙවිය යුතු ය. සෙසු මාර්ග සඳහා වාහන හුවමාරු ස්ථාන ඇත. මෙම අධිවේගී මාර්ග ගුවන් පාලම් සහ උමං මාර්ගවලින් ද යුක්ත ය. මාර්ග සංඥා අදාළ ස්ථානවල නිවැරදි ව යොදා ඇත. වේග සීමා සටහන් කර ඇත. එබැවින් මාර්ග නීති නිවැරදි ව පිළිපැදීමෙන් අනතුරු අවම කර ගත හැකි ය.

(i) ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය ඉදිකරන ලද්දේ කුමන නගර යා කරමින් ද?
(ii) අධිවේගී මාර්ග ඉවහල් වන්නේ කුමක් සඳහා ද?
(iii) මෙම අධිවේගී මාර්ගයේ මංතීරු ගණන කීය ද?
(iv) අධිවේගී මාර්ගවල ගමන් කිරීමේ දී ගාස්තු ගෙවිය යුත්තේ කොහේදී ද?
(v) අනතුරු අවම කර ගැනීමට කළ යුත්තේ කුමක් ද?

**4 ප්‍රශ්නය - අපේක්ෂිත උත්තර**

(i) ගාල්ල කොළඹ අතර
කොළඹ ගාල්ල අතර

(ii) අපේ රටේ ශීඝ්‍ර සංවර්ධනයට
සංවර්ධනය සඳහා

(iii) මංතීරු හතරකි / හතරකි / 4 යි

(iv) පිටවීමේ දී ගාස්තු ගෙවිය යුතුය.
පිටවීමේ දී
පිටවන ස්ථානයේ දී

(v) මාර්ග නීති නිවැරදිව පිළිපැදීම
මාර්ග නීති පිළිපැදීම
මාර්ග සංඥාවලට අවනත වීම

**(ලකුණු 02 x 5 = 10 යි)**

## 5 ප්‍රශ්නය

**අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන කුසලතා මැන බැලීම**

### III කොටස / பகுதி III / Part III

- **5** හා **6** යන ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.
  **5, 6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
  Answer **both** questions **5** and **6**.

**5.** ග්‍රැෆික්-ලංකා පුද්ගලික ආයතනය පරිගණක දත්ත සහායකයන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවා ඇත.

- ශ්‍රී ලාංකේය පුරවැසියෙකු වීම
- වයස අවුරුදු 18 - 35 අතර වීම
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී තිබීම
- පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම
- සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ

ඔබ රසිකා නානායක්කාර යැයි සිතන්න. ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇති බැවින් අදාළ තොරතුරු ඇතුළත් කරමින් අයදුම්පතක් සකස් කරන්න.
நீங்கள் ரஷிகா நாணாயக்கார எனக் கருதுக. நீங்கள் மேற்குறித்த தகைமைகளைப் பூர்த்திசெய்துள்ளமையால், குறித்த தகவல்களை உள்ளடக்கி விண்ணப்பப்படிவம் ஒன்றைத் தயாரியுங்கள்.
Imagine you are Rasika Nanayakkara. As you have fulfilled the above qualifications, prepare an application with relevant information.

**නැතහොත්**
**அல்லது**
**Or**

ඔබ පාසලේ වාර්ෂික කලා උලෙළ මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට විදුහලේ කලා සංගමය තීරණය කර ඇත. පාසලේ විදුහල්පති කාංචනා කරුණානායක ඔබ යැයි සිතා මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වන ලෙස ඉල්ලමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත විදුහල්පති යවන ලිපිය සකස් කරන්න. (වචන **50** ක් පමණ භාවිත කරන්න.)

உங்கள் பாடசாலையின் வருடாந்த கலைவிழா இம்முறையும் விமரிசையான முறையில் கொண்டாடுவதற்கு பாடசலைக் கலாமன்றம் தீர்மானித்துள்ளது. நீங்கள் பாடசாலை அதிபர் காஞ்சனா கருணாநாயக்க என உங்களைக் கருதிக்கொண்டு, இவ்விழாவுக்குப் பிரதம அதிதியாகக் கலந்துகொள்ளுமாறு அழைப்பு விடுத்து வலயக் கல்விப் பணிப்பாளருக்கு அதிபர் அனுப்பும் கடிதத்தை எழுதுக. (ஏறத்தாள **50** சொற்களில் எழுதுக.)

The Art Society of your school has decided to hold the Annual Art Festival in a splendid way this year too. Imagine you are the principal of the school, Kanchana Karunanayake and prepare the letter that the principal sends to the Zonal Director of Education requesting to participate in that event as the chief guest. (Use about **50** words.)

I. **අයැදුම්පත**

| | | | |
|---|---|---|---|
| **(අ)** | ආකෘතිය | - | ලකුණු 03 යි |
| **(ආ)** | අන්තර්ගතය | - | ලකුණු 05 යි |
| **(ඇ)** | ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි |

(අ) ආකෘතිය - ලකුණු 03 යි

* මාතෘකාව ***ලකුණු 01 යි.***
* නම, ලිපිනය ඇතුළු ව කරුණු පෙළ ගැස්වීම ***ලකුණු 01 යි.***
* අත්සන හා දිනය ***ලකුණු 01 යි.***

(ආ) අන්තර්ගතය - ලකුණු 05 යි

* ශ්‍රී ලාංකේය පුරවැසියකු වීම ***ලකුණු 01 යි.***
* වයස අවුරුදු 18 - 35 අතර වීම ***ලකුණු 01 යි.***
* අ.පො.ස. (සා.පෙළ) සමත් වීම ***ලකුණු 01 යි.***
* පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම ***ලකුණු 01 යි.***
* සේවා පළපුරුද්ද ***ලකුණු 01 යි.***

ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි

ව්‍යවහාරික සරල වියරණ රීතී රැකීම, පැහැදිලි අත් අකුරු, පද බෙදා ලිවීම, විරාම ලකුණු භාවිතය ආදි කරුණු සමස්තයක් ලෙස සලකා ලකුණු තීරණය කරන්න.

*නැතහොත්*

**රාජකාරි ලිපිය**

(අ) ආකෘතිය - ලකුණු 04 යි
(ආ) අන්තර්ගතය - ලකුණු 04 යි
(ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි

(අ) ආකෘතිය - ලකුණු 04 යි

* යවන්නාගේ ලිපිනය සහ දිනය - ***ලකුණු 01 යි.***
* ලබන්නාගේ තනතුර, ලිපිනය හා ආමන්ත්‍රණය - ***ලකුණු 01 යි.***
* මාතෘකාව - ***ලකුණු 01 යි.***
* අවසානය (අත්සන හෝ නම) - ***ලකුණු 01 යි.***

(ආ) අන්තර්ගතය - ලකුණු 04 යි

* කලා සංගමයේ තීරණය - ***ලකුණු 01 යි.***
* වාර්ෂික කලා මංගල්‍යය පැවැත්වෙන බව - ***ලකුණු 01 යි.***
* ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වන අය - ***ලකුණු 01 යි.***
* සහභාගි වන ලෙස කරන ඉල්ලීම - ***ලකුණු 01 යි.***

(ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි

ව්‍යවහාරික සරල වියරණ රීතී රැකීම, පැහැදිලි අත් අකුරු, පද බෙදා ලිවීම, විරාම ලක්ෂණ භාවිතය ආදි කරුණු සමස්තයක් ලෙස සලකා ලකුණු තීරණය කරන්න.

## 6 ප්‍රශ්නය

**අපේක්ෂණය - පරිවර්තන හැකියාව මැන බැලීම**

**6.** පහත දැක්වෙන දෙමළ / ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala**.

(i) திங்கட்கிழமை பரிசளிப்பு விழா நடைபெறும்.
(ii) ஆசிரியை சிரித்துக்கொண்டு வகுப்புக்கு வந்தாள்.
(iii) மாலைப்பொழுதில் வானம் அழகாகக் காட்சி தருகிறது.
(iv) திருகோணமலையில் இயற்கைத் துறைமுகம் அமைந்துள்ளது.
(v) நுவரெலியா அழகான மலைப் பிரதேசமாகும்.

(i) The prize giving ceremony will be on Monday.
(ii) The teacher entered the class with a smile.
(iii) The sky seems beautiful in the evening.
(iv) There is a natural harbour in Trincomalee.
(v) Nuwara Eliya is a beautiful hill country.

**නැතහොත්**
**அல்லது**
**Or**

විදුහල්පතිතුමා ඔබව කාර්යාලයට කැඳවා ඇත. ඔබ කාර්යාලයට ගිය පසු විදුහල්පතිතුමා ඔබගෙන් පවුලේ තොරතුරු විමසයි. ඔබ සහ විදුහල්පතිතුමා අතර ඇතිවන සංවාදය ලියන්න. ඒ සඳහා පහත සඳහන් කරුණු උපයෝගී කර ගන්න. (වාක්‍ය **10** ක් ප්‍රමාණවත් වේ.)

அதிபர் உங்களை அலுவலகத்துக்கு அழைத்துள்ளார். நீங்கள் அலுவலகத்துக்குச் சென்ற பின்னர் அதிபர் உங்கள் குடும்பத் தகவல்களை விசாரிக்கின்றார். உங்களுக்கும் அதிபருக்கும் இடையே இடம்பெறும் உரையாடலை எழுதுக. அதற்காக பின்வரும் விடயங்களைப் பயன்படுத்துக. (**10** வாக்கியங்கள் போதுமானது.)

The principal has asked you to come to the office. He asks about your family details after you go there. Write the dialogue that takes place between you and the principal. Use the following facts for it. (**10** sentences are sufficient.)

(i) කාර්යාලයට පිවිසීමට අවසර ගැනීම
(ii) විදුහල්පතිතුමා තොරතුරු විමසීම
(iii) ඔබ ලබා දෙන පිළිතුරු
(iv) සමුගැනීම

(i) තෑගි බෙදා දීමේ උත්සවය සඳුදා පැවැත්වේ.
සඳුදා තෑගි ප්‍රදානය කිරීමේ උත්සවය පැවැත්වේ.

(ii) ගුරුතුමිය / ගුරුතුමා සිනාසෙමින් / හිනාවෙමින් ආවාය / පැමිණියාය

(iii) සවස් කාලයේ අහස ලස්සනට දිස්වෙයි / පෙනෙයි.
සන්ධ්‍යා අහස ලස්සනට පෙනෙයි / දිස්වෙයි.

(iv) ත්‍රිකුණාමලයේ ස්වාභාවික වරායක් ඇත. / පිහිටා ඇත.
ස්වාභාවික වරායක් ත්‍රිකුණාමලයේ ඇත. / පිහිටා ඇත.

(v) නුවරඑළිය ලස්සන කඳුකර ප්‍රදේශයකි. / කඳු රටකි.

**(ලකුණු 02 x 5 = 10 යි)**

- ❖ එක් වාක්‍යයකට ලකුණු 02 බැගිනි. මෙම අදහස ලැබෙන ලෙස ලියා ඇති වෙනත් පිළිතුරු ද පිළිගන්න. වාක්‍යවල උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය. අක්ෂර වින්‍යාසයේ වැරදි නොසලකා හරින්න.

- ❖ සමස්ත වාක්‍යය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු 02 ක් ද අදහස් පමණක් ලියා ඇත්නම් ලකුණු 01 ක් ද පිරිනමන්න.

ශිෂ්‍යයා හා විදුහල්පතිතුමා අතර සංවාදය

1. කාර්යාලය පිවිසීමට අවසර ගැනීම
   - ශිෂ්‍යයා - කාර්යාලයට පිවිසීමට අවසර ඉල්ලීම - ලකුණු 01 යි
   - විදුහල්පතිතුමා - කාර්යාලයට පැමිණීමට අවසර දීම - ලකුණු 01 යි
2. විදුහල්පතිතුමා විමසන කරුණු 03 කට
   - එක් කරුණකට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි
3. ශිෂ්‍යයා ලබාදෙන පිළිතුරු 3 ක් සඳහා
   එක් පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි
4. සමුගැනීම
   විදුහල්පතිතුමා - ලකුණු 01 යි
   ශිෂ්‍යයා - ලකුණු 01 යි

**(ලකුණු 10 යි)**